# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2463/47 - 2025 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2025.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී-බී 9/73(XII)අ

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තියේ (1) වන සහ (4) වන උපවගන්ති යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන සහ (4) වන උපවගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පරිසර අමාත්‍ය හෙට්ටිතන්ත්‍රි පටබැඳිගේ දම්මික වන මා විසින්.

(අ) 2024 මැයි මස 06 වැනි දින අංක 2383/05 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මෙයින් ඉවත් කරනු ලබන බවට; සහ

(ආ) 2016 මාර්තු මස 01 වැනි දින අංක 1956/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ විස්තර කර ඇති භූමි ප්‍රදේශය, මෙම නියමය පළ කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි, ස්වභාව රක්ෂිතයක් විය යුතු බවට සහ එම ස්වභාව රක්ෂිතය "වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු බවට,

මේ නියමය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**හෙට්ටිතන්ත්‍රි පටබැඳිගේ දම්මික,**
පරිසර අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 21 වැනි දින
කොළඹ දී ය.

EOG 11 - 0172

1A - PG 7358 — 603 (2025/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*